| |
|---|
| සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා<br>චක්‍රලේඛ ලිපි අංක 12 /2025 |

මගේ අංක:-PPSC/ES/14/FI/06/3-3
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභාව,
නවනගරය,
රත්නපුර
2025.05. 09

01. ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය,ස.ප.ස
02. ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,ස.ප.ස
03. සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය,ස.ප.ස
04. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු
05. සියලුම පළාත් අධ්‍යක්ෂවරුන්/කොමසාරිස්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්
06. සියලු ප්‍රාදේශිය ලේකම්වරු,රත්නපුර/කෑගල්ල
07. පළාත් පාලන ආයතන ලේකම්වරුන්

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

සබරගමුව පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/02/P2/11/SIRM/DEP/02- හා 2024.07.05 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි හා **රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2023.12.27 දිනැති ඔහුගේ අංක MPS/HRD/HR03/Recru.Process/2022/06 දරණ ලිපියෙන් ලබා දී ඇති උපදෙස් පරිදි,** සබරගමුව පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/6/8/1(2) හා 2024.12.31 දිනැති ලිපියෙන් හා පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/6/8/1 (2 වෙළුම) හා 2025.04.17 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි මෙම බඳවා ගැනීම් සීමිත පදනමින් **මෙවරට පමණක් විශේෂ වන සේ සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සක්‍රිය සේවයේ නියුතු සහ පත්වීම් ස්ථිර කර ඇති සංවර්ධන** නිලධාරීන්ගෙන් බඳවා ගැනීමට සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව,සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් **සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සක්‍රිය සේවයේ නියුතු සහ පත්වීම් ස්ථිර කර ඇති සංවර්ධන නිලධාරීන්ගෙන් මෙවරට පමණක් විශේෂ වන සේ** අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ඉදිරියේ දී රත්නපුර නගරයේදී පැවැත්වීමට අපේක්ෂිතය. අයදුම්පත් ලැබෙන ප්‍රමාණය අනුව කෑගල්ල නගරයේ විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් තීරණය කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් ඔබගේ හා ඔබ යටතේ සියලු දෙපාර්තමේන්තු/ආයතන/මූලික රෝහල්/සෞ.වෛ.නි/ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අනුයුක්තව සක්‍රිය සේවයේ නියුතු සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පත්වීම ස්ථිර කර ඇති සංවර්ධන නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන මෙන් කාරුණිකව දන්වමි. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ** www.psc.sg.gov.lk **හා සබරගමුව පළාත් වෙබ් අඩවියට** www.sg.gov.lk යොමු කර ඇත.

**01. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කිරීම සඳහා අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව 03 (තුන) කි.** ඉදිරියේ දී ලබා දෙන අනුමැතිය මත නැවත පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය මෙම කොමිෂන් සභාව සතුවේ.

**02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2025.06.15**

**03. බඳවා ගැනීමේ සුදුසුකම් :-**

**3.1 අධ්‍යාපන සුදුසුකම් :-**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඕනෑම උපාධියක්.
(ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව විෂය ධාරාවක් ලෙස හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.)

**3:1 පොදු සුදුසුකම් :-**

(අ) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(ඇ) 2025.06.15 දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(ඈ) සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සක්‍රිය සේවයේ නියුතු, පත්වීම ස්ථිර කර ඇති, සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරියකු විය යුතු අතර වයස් සීමාව අදාළ නොවේ.

04. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය:-

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය (MN 4 – 2025) වේ.

**රු: 53,060- 10X800 - 11X1,190 – 10X1,320- 5X1,350 -රු 94,100 (MN 4 –2025)** වේ.

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

05. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතුවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය:-

පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල අදාළව කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්නපත්‍ර දෙකකින් (02) යුත් විභාගයක් පවත්වනු ලබයි.අපේක්ෂකයන් විසින් විභාගයේ සියලුම විෂයයන්ට පෙනී සිටිය යුතු වේ.එම විෂයයන් හා විෂය නිර්දේශය සහ එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත පරිදි වේ.

| අනු අංකය | විෂයය | විෂය නිර්දේශය | ලකුණු ප්‍රමාණය | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය | කාලය පැය |
|---|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතාවය හා බුද්ධි පරික්ෂණය | භාෂා හැකියාව, ගණිතමය කුසලතාව, තාර්කික ශක්තිය හා සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය (කෙටි ප්‍රශ්න වලින් සමන්විතයි.) | 100 | 40 | පැය 01 |
| 02 | සාමාන්‍ය දැනීම | සාමාජීය, ආර්ථික, දේශපාලනික යන විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්න ඇතුළත් වේ. | 100 | 40 | පැය 01 |

මෙම විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා නොදේ. විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ. පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබුණහොත් විභාගයක් පැවැත්වීම පිළිබඳ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

07. අයදුම් කිරීමේ ක්‍රමය

7:1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.2 විභාග ගාස්තුව රු. 600/=කි. මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතනවලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

7:3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් අදාළ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර අමාත්‍යාංශයේ ලේකම් මගින් 2025.06.15 දිනට පෙර මා වෙත යොමු කළ යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2025"** යනුවෙන් සඳහන් කළයුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7:4 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.5 මෙම විභාගය පදනම් කරගනිමින් පුරප්පාඩු සංඛ්‍යාවට අමතරව නැවත ඇති වන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීමේ බලය ද කොමිෂන් සභාව සතු වේ.එසේම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ බලය ද සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

7.6 මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය.

ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2025.05. ෙ9

**ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක**
**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත.**

## ආදර්ශ අයදුම්පත්‍රය

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2025

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
(අදාල අංකය කොටුව තුළ ලියන්න )
සිංහල - 1
දෙමළ - 2

විභාගයට පෙනීසිටීමට කැමති නගරය
රත්නපුර [ ]
කෑගල්ල [ ]

01. අ. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :-.........................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

ආ. සම්පූර්ණ නම:-..........................................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

ඇ. සම්පූර්ණ නම :-.........................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

ඉ. දුරකථන අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. I. ස්ථිර ලිපිනය :-.........................................................................................................

II. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- රත්නපුර [ ] කෑගල්ල [ ]

III. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන 2025.06.15 දිනට සබරගමුව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව
අවුරුදු [ ] මාස [ ] දින [ ]

IV. සබරගමුව පළාත් සංවර්ධන නිලධාරී පත්වීමක් ලැබූ දිනය ;- ...........................
V. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවා කාලය :- අවු......මාස....දින...
VI. සබරගමුව පළාත් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ දිනය:-.....................
(2025.06.15 අයදුම්පත් බාරගන්නා අවසන් දින හෝ ඊට පෙර දිනයක් විය යුතු යි. )
VII. සංවර්ධන නිලධාරී පත්වීම ස්ථිර කර ඇති/නැති බව :-.......................

03. I. ස්ත්‍රී/ පුරුෂ භාවය :- [ ]
ස්ත්‍රී-1, පුරුෂ-0
(අදාල අංකය කොටුව තුල ලියන්න.)

II. උපන්දිනය :- වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2025.06.15 දිනට වයස :-
අවුරුදු [ ] මාස [ ] දින [ ]

04. අධ්‍යාපන සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධිය පිළිබඳ විස්තර

| විශ්ව විද්‍යාලය | හදාරා ඇති උපාධිය | කාලසීමාව | සාමාර්ථය | උපාධි සහතිකපත් වලංගු දිනය<br>**(Effective date)**<br>2025.06.15 හෝ ඊට පෙර විය යුතු යි |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය:- ......................................
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:- ..........................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

06. අයදුම්කරුගේ සහතිකය •

.......................................................................................................................................................

.වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යයි සොයාගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:- 2025. ......................................
අයදුම්කරුගේ අත්සන

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
**( අනවශ්‍ය වචන කපා හරින්න )**
**(පෞද්ගලික ලිපිගොනුව තබත්තු කරන ආයතන ප්‍රධානියා හෝ බලයලත් නිලධාරියකු විය යුතු යි.)**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ......................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, දැනට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ........................................................අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සංවර්ධන නිලධාරියකු වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහු/ඇය ................................. දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ නම:-..........................................................................
අත්සන :-................................................
තනතුර හා නිල මුද්‍රාව

සබරගමුව පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ( අනවශ්‍ය වචන කපා හරින්න ).

..............................................................................................................................මයා/මිය/මෙනවිය
දැනට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ..........................................................අමාත්‍යාංශයේ/
දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ........................................................ වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්,සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම ස්ථිර කර ඇත/නැති බවත් ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය :-2025. .

.........................................

ලේකම්/ ලේකම් වෙනුවට අත්සන

( නිල මුද්‍රාව තබන්න)